


***ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) වන අපි, විශිෂ්ටත්වය සඳහා විශිෂ්ටයින් බඳවා ගන්නා සහ සියලු දෙනාට සමාන රැකියා අවස්ථා ලබාදෙන සේවායෝජකයෙක් වන්නෙමු.***

***මෙම සමාගමේ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA) පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.***

**කාර්මික ශිල්පී තනතුර - භූමි සහායක උපකරණ**

(POST OF TECHNICIAN - GROUND SUPPORT EQUIPMENT)

**රැකියාවේ ස්වභාවය** : සියලුම භූමි සහායක උපකරණ (GSE) වල ප්‍රශස්ත කාර්යසාධනය, ආරක්ෂාව සහ අඛණ්ඩ භාවිතයට ඇති හැකියාව සහතික කිරීම සඳහා නියමිත පරිදි නඩත්තු කටයුතු, පරීක්ෂා කිරීම් සහ සේවා කටයුතු සිදු කිරීම. භූමි සහායක උපකරණ කාර්මික ශිල්පියා විසින් දෛනික නඩත්තු කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම, එක් එක් උපකරණයට අදාළ නඩත්තු කාලසටහන් සකස් කිරීම සහ කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම මෙන්ම, ගුවන් තොටුපළ ගොඩබිම් මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා භූමි මෙහෙයුම් කණ්ඩායම සමඟ සමීපව සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම වගකීම වේ.තවද, භූමි සහායක උපකරණවල නඩත්තු කටයුතු සම්බන්ධ සියලු කරුණු සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කිරීම ද මෙම තනතුරේ ප්‍රධාන වගකීමකි.

**රැකියාවේ වගකීම් :**

i. සියලුම භූමි සහායක උපකරණවල දෛනික නඩත්තු පරීක්ෂා කිරීම් සහ සේවා හැකියාව පිළිබඳ ඇගයීම් සිදු කිරීම.

ii. නිෂ්පාදකයා විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව, බිඳවැටීම් වැළැක්වීමේ නඩත්තු කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

iii. උපකරණ භාවිතයෙන් ඉවත්ව පවතින කාලය අවම වන පරිදි කාලෝචිතව අලුත්වැඩියා කිරීම් සහ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු සිදු කිරීම.

iv. භූමි සහායක උපකරණ සමූහයේ මෙහෙයුම් තත්ත්වය සහ කාර්යසාධනය අධීක්ෂණය කරමින්, හඳුනාගනු ලබන කිසියම් අඩුපාඩුවක් හෝ දෝෂයක් වේ නම් ඒ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

v. උපකරණවල තත්ත්වය, අවශ්‍යතා සහ යාවත්කාලීන තොරතුරු වාර්තා කිරීම සඳහා බිම් මෙහෙයුම් අධිකාරී (RAMP) සහ භූමි මෙහෙයුම් කළමනාකරු සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.

vi. සිදු කරනු ලබන නඩත්තු කටයුතු, පරීක්ෂා කිරීම් සහ භාවිත කරන ලද අමතර කොටස් පිළිබඳ නිවැරදි වාර්තා පවත්වාගෙන යාම.

| | | | |
|---|---|---|---|
| | | vii | සියලුම නඩත්තු කටයුතු සිදු කිරීමේදී අදාළ ආරක්ෂක ප්‍රමිතීන් සහ මෙහෙයුම් ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම පිළිබඳව සහතික වීම. |
| | | viii | CIAR සහ JIA ගුවන් තොටුපළ දෙකෙහිම සමස්ත භූමි සහායක උපකරණ සමූහයේ නඩත්තු කටයුතු කළමනාකරණය කිරීම. |
| | | xi | සියලුම භූමි සහායක උපකරණ සම්බන්ධ ප්‍රධාන තාක්ෂණික සම්බන්ධතා නිලධාරියා ලෙස කටයුතු කරමින්, දෛනික මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ප්‍රමාණවත් ලෙස ලබා ගත හැකි සහ භාවිතයට සූදානම් තත්ත්වයේ පවතින බව සහතික කිරීම. |
| | | x | පවරනු ලබන සියලුම කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ආයතනයේ තොරතුරු වත්කම් ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සහ AASL ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටි සමඟ අනුකූලතාව පවත්වාගෙන යාම සහතික කිරීම.. |
| | | xi | භූමි සහායක උපකරණ ක්‍රියාකරුගේ ඉහත සඳහන් ප්‍රධාන වගකීම්වලට අමතරව, අධීක්ෂණ නිලධාරීන් විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් ඕනෑම වගකීමක් හා කාර්යයක් ඉටු කිරීම. |
| 1. | **සුදුසුකම් සහ සේවා පළපුරුද්ද : :** | i | ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ මෝටර් රථ කාර්මික හෝ වාහන විදුලි ක්ෂේත්‍රයෙන් දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් මෝටර් රථ කාර්මික / වාහන විදුලි කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.<br>හෝ<br>මෝටර් රථ කාර්මික / වාහන විදුලි කාර්මික ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ 4) වෘත්තීය සහතිකයක් ලබා තිබීම.<br>සහ |
| | | ii | භූමි සහායක උපකරණ නඩත්තු ක්ෂේත්‍රයේ පුහුණු කාලය ද ඇතුළුව, සමස්ත වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.<br>සහ |
| | | iii | වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් තිබීම. |
| 2. | **වයස** | : | අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| 4. | **වැටුප** | : | තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ආකර්ෂණීය වැටුපක් හිමිවන අතර, ආකර්ෂණීය අමතර වරප්‍රසාද ද හිමි වේ. |
| 5. | **බඳවා ගැනීමේ ක්‍රමය** | : | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්. |

**<u>පොදු කරුණු</u>**

**භාෂා දැනුම:** **ඉංග්‍රීසි සහ සිංහල භාෂා දෙකෙහිම ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතාවය මනා මට්ටමකින් තිබිය යුතුය. දෙමළ භාෂාව පිළිබඳ දැනුමක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.**

**යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (JIA) සඳහා පවතින පුරප්පාඩු පිරවීමේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.**

**යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (JIA) සේවය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සඳහා සමාගම විසින් නවාතැන් පහසුකම් හෝ ප්‍රවාහන පහසුකම් සපයනු නොලැබේ.**

තෝරාගනු ලබන අපේක්ෂකයන්ට අවශ්‍යතාව පරිදි සහ අවශ්‍ය වන අවස්ථාවලදී දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි සමාගමේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සිදුවනු ඇත.

ඔබ මේ සඳහා උනන්දුවක් දක්වන්නේ නම් සහ ඊට අදාළ සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කළ අයදුම්පතක්, අදාළ සහතිකවල පිටපත් සමඟ **"සභාපති, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක"** යන ලිපිනය වෙත **2026 ඔක්තෝබර් 01 වන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **<u>ලියාපදිංචි තැපෑලෙන් හෝ කූරියර් සේවාවක් මඟින් පමණක් යොමු කළ යුතුවේ</u>**. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ ඉහත සඳහන් මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මෙම පුරප්පාඩු දැන්වීම අවලංගු කිරීම හෝ නැවත කැඳවීමේ පූර්ණ අයිතිය සමාගම සතු වන අතර තෝරා ගැනීම් ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනයන්හි සඳහන් කරුණු පිළිබඳ අපැහැදිලිතාවයක් ඇති වුවහොත් ඉංග්‍රීසි දැන්වීමේ කරුණු බලපැවැත්වෙන බව කරුණාවෙන් සළකන්න.

**සභාපති**
**ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා)(පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ**
**කටුනායක**

**දැන්වීම.** 13/09/2026